**අක්මීමන ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 07 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 20 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.7,213,928 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හා සමාලෝචිත වර්ෂයේ දී එම ගෙවීම ප්‍රාග්ධන වියදම් ගිණුමට හර කිරීම නිසා සමුච්චිත අරමුදල හා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.7,213,928 බැගින් වැඩියෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 18 ක් වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.10,011,119 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.10,011,119 ක් බැගින් අඩුවෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 29 ක් වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් රු.13,916,372 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.13,916,372 ක් බැගින් අඩුවෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද නව බහුකාර්ය ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.2,367,833 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිළදී ගන්නා ලද රු.103,000 ක් වූ ලී බඩු හා සවිකිරීම් සහ රු.33,850 ක් වූ යන්ත්‍ර හා උපකරණ වශයෙන් එකතුව රු.136,850 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) රු.1,147,800 ක් වූ ස්ථාවර වත්කම් මිළදී ගැනීම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනාව රු.1,198,750 ක් වුවද, රු.500,250 ක් වූ යතුරුපැදි ණය වාරික අය කිරීම් අඩුකර රු.698,500 ක් පමණක් සභික දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.500,250 කින් අඩුවෙන් දැක්විණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.445,677 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.37,937,333 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, තක්සේරු වාර්තා, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ හා විධිමත්ව පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් ලේඛනය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

**(අ) විදේශ අධ්‍යයන චාරිකා**

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 02 ක් සඳහා සභාපති, උප සභාපති හා සභිකයින් 12 දෙනෙකු වෙත රු.1,270,855 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එමෙන්ම විදේශගතවීමට විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

(ආ) උත්සව වියදම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි විය යුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතු වුවත් අනුමැතිය නොලබා උත්සව තුනක් සඳහා රු.116,218 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.3,454,571 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.2,617,686 ක් විය.

### 2.2 බැංකු ගිණුම්

(i) **කර්මාන්ත වැය දැරීම සඳහා වෙනමම ජංගම ගිණුමක් පවත්වා නොතිබුණු අතර සියලුම ගනුදෙනු එක් ගිණුමක් මගින් සිදුකර තිබුණි.**

(ii) **බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දී හඳුනාගෙන තිබූ වටිනාකම රු.7,952 ක දෝෂයන් ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.**

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් හා අක්කර බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.3,881,981 ක් වූ වරිපනම් බදු සහ රු.314,477 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.3.2 බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.504,447 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.3.3 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.155,852 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.1,731,110 ක උසාවි දඩ හා රු.27,032,741 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2011 වර්ෂයේ දී උප සභාපති හා සභිකයින් තිදෙනෙකු ද, 2012 වර්ෂයේ දී උප සභාපති හා සභිකයින් 08 දෙනෙකු ද, 2013 වර්ෂයේ දී සභාපති, උප සභාපති හා සභිකයින් 11 දෙනෙකු හා 2014 වර්ෂයේ දී සභාපති, උප සභාපති ඇතුළු සභිකයින් 12 දෙනෙකු විසින් 2015 සැප්තැම්බර් 25 දින වනවිට ද වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අරමුදල් යැවීම නියමිත දිනට සිදු නොකිරීම මත පනවනු ලැබූ රු.140,457 ක අධිභාර මුදලක් ගෙවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.8,684 ක් සේවා නියුක්ත භාර අරමුදලට අධිභාර මුදලේ කොටසක් ලෙස සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

**(ආ)** ස්ථාන මාරු වී ගිය සේවකයින් 05 දෙනෙකුගෙන්, සේවය හැර ගිය සේවකයින් 02 දෙනෙකුගෙන් හා සේවය අත්හිටුවා ඇති සේවකයින් 03 දෙනෙකුගෙන් වර්ෂ 16 ක කාලයක සිට හිඟව පවතින රු.147,526 ක් වූ ණය අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** සභාව විසින් 2010 වර්ෂයට පෙර රු.287,461 ක් හා 2012 වර්ෂයට පසු රු.29,000 ක් වශයෙන් ලබා දී තිබුණ ද, රු.316,461 ක අත්තිකාරම් මුදල පියවා නොතිබුණි.

### 3.3 ගාලු ඇසළ අසිරිය වැඩසටහන

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුතු කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් යම් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක්දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එලෙස විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2014 ජූලි 11 සිට 15 දින දක්වා සභාව විසින් පවත්වා තිබූ ඇසළ කලාපයේ වියදම් ලෙස රු.686,018 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

(ii) ඇසළ කලාපයේ වියදම් සඳහා ආධාර ලෙස මුදලින් රු.357,330 ක් හා ද්‍රව්‍ය ආධාර ලෙස රු.10,000 ක් ලැබී ඇති බව වාර්තාවල දැක්වුවද, එම මුදල් සභා අරමුදල වෙත ලබාගෙන වැයකර නොතිබුණි.

(iii) ඇසළ කලාපය වෙනුවෙන් 2014 අගෝස්තු 26 දින රු.30,000 ක මුදලක් හා 2014 ජූලි 22 දින රු.125,000 ක මුදලක් රාජ්‍ය ආයතන දෙකකින් ලැබී තිබුණ ද, එම මුදලින්

රු.64,000 ක් පමණක් වැය කර, ඉතිරි මුදල වූ රු.91,000 ක් නිෂ්ක්‍රීයව පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**3.4 අවිධිත් ගනුදෙනු**

--------------------

**පුහුණු වැඩමුළු සඳහා වියදම් දැරීම**

**------------------------------------**

සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයට පුහුණු වැඩමුළුවක් සහ සුහද හමුවක් පැවැත්වීම සඳහා සංවිධාන කටයුතු වෙනුවෙන් රු.100,000 ක මුදලක් සභා අනුමැතියකින් තොරව 2014 දෙසැම්බර් 26 දින සභාවේ ලේකම් වෙත ගෙවා තිබුණි.

(අ) 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී/1/40 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ලිපියේ (iii) ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සිය රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතු අතර දේශීය සංචාරවලදී ආහාර පාන හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළයුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව 2014 දෙසැම්බර් 27 දින පුද්ගලික හෝටලයක පැවැත්වීමට නියමිතව තිබූ පුහුණු වැඩමුළුව හා සුහද හමුව වෙනුවෙන් රු.90,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) වැඩමුළුව වෙනුවෙන් සහභාගී වූ සංඛ්‍යාව පිළිබඳ කිසිදු සාක්ෂියක් අනාවරණය නොවීය.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 106 ප්‍රකාරව යම් මුදලක් ලැබිය යුතු කවර හෝ පාර්ශවයන් වෙත එම ගෙවීම සඳහා වවුචර්, උපලේඛන හෝ උප වවුචර් සමඟ ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව සෑම ගෙවීමක්ම මුදල් ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත්, අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සියකින් තහවුරු වියයුතු වුවත්, පුද්ගලික හෝටලයට මුදල් ගෙවීම් කළ බවට තහවුරු නොවීය.

**3.5 නිෂ්ක්‍රීය වත්කම්**

**------------------**

2013 ජුනි 05 දිනැති අංක: PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, සභාව භාරයේ ඇති රු.1,000,000 කට අගය තක්සේරු කර ඇති ඩබල් කැබ් රථය හා වටිනාකම හඳුනා ගත නොහැකි අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලර් 02 ක් හා වතුර බවුසරයක් සහා භූමියේ නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**--------------------------**

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 04 ක නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදු කරනු ලැබුව ද, විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 25 වනවිටත් එකී වාහනවල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

1993 පෙබරවාරි 28 දින ගාල්ල ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලැබී තිබූ කැබ් රථයක් සඳහා වාහනයේ ලියාපදිංචි කිරීමේ සහතිකය සභාව භාරයේ නොතිබුණි. එසේම 2010 වර්ෂයේ සිට ආදායම් බලපත්‍රය හා වාහන රක්ෂණ සහතිකය ලබා ගැනීමකින් තොරව සභාව විසින් වාහනය ධාවනයේ යොදවමින් පැවතුණි.

**3.7 හඳුනාගත් අලාභ**

(i) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුලදී 1 1/4" ගැල්වනයිස් බට **(GI PIPE)** 616 ක් සභාව වෙත ලබා දී තිබූ අතර, ඒවා ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ii) සභාව සතුව ගැල්වනයිස් බට 572 ක් පමණක් පැවති බව නිරීක්ෂණය වූයෙන් සභාවට ලබා දී තිබූ බට 44 ක ඌනතාවයක් පැවතුණි. එහි වටිනාකම රු.48,708 ක් විය.

**3.8 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

සභා බලප්‍රදේශය තුල ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 හා 2014 වර්ෂවල දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ලැබී තිබූ රු.735,000 ක් අදාල ව්‍යාපෘති සඳහා භාවිතා නොකර, විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 25 දින වනවිටත් බැංකු ගිණුමෙහි නිෂ්ක්‍රීයව රඳවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

**4.2 පිළිතුරු නොදුන් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 14 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.12,847,108 ක් විය.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය